023

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 06 - ශ්‍රේණිය

## චිත්‍ර කලාව

කාලය: පැය 02යි.
(I කොටස හා II කොටස සඳහා)

නම/විභාග අංකය :- ..........................................................................

### I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා වූ ප්‍රශ්නවලට අදාල පිළිතුර පහත සඳහන් වරහන් තුළ ඇති පිළිතුරු අතරින් තෝරා හිස්තැන් පුරවන්න

(රේඛා / එකලස් / කඩ / කොලාජ් / ශ්‍රැෆික් )

(01) වර්ණවත් සඟරා ඉරා ඇලවීමෙන් ................................................ චිත්‍ර නිර්මාණය කරගත හැකි ය.

(02) ඉවතලන ප්ලාස්ටික්, කහඩු, ලී යනාදිය ................................................ කිරීමෙන් මූර්ති නිර්මාණය කළ හැකි ය.

(03) ................................................ චිත්‍ර ඇඳීමට පැන්සල පමණක් ප්‍රමාණවත් වේ.

(04) රතු වර්ණයෙන් රතු වර්ණය ඉවත් කළ විට ................................................ වර්ණ ලැබේ.

(05) සිදුරු කහඩු මගින් ද ................................................ චිත්‍ර නිර්මාණය කළ හැකි ය.

(ලකුණු 2 × 5 - 10)

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා වූ ප්‍රශ්නවලට අදාල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(06) ඈත පෙන්වීමේ දී පර්යවලෝකන ලක්ෂණය අනුව වස්තූන්

(1) කුඩාවට පෙනෙයි.
(2) විශාලව පෙනෙයි.
(3) සමාන ප්‍රමාණයෙන් පෙනෙයි.
(4) නිල් පාටින් පෙනෙයි.

(07) පොත් පිට කවරයක් නිර්මාණය කිරීමේ දී කළ යුතු වන්නේ,

(1) මුල් පිටුව හා පසු පිටුවයි.
(2) මුල් පිටුව පමණි.
(3) මුල් හා අග පිටු සහ පොතේ සහනම පෙන්වීමයි.
(4) අග පිටුව පමණක් පෙන්වීමයි.

(08) සාර්ථක පැරපිලි මෝස්තරයක් නිර්මාණය කිරීමට යොදා ගන්නා හැඩතල සහ වර්ණ

(1) රටාවක් අනුව යෙදිය යුතුය.
(2) අවිධිමත් ලෙස යෙදිය යුතු ය.
(3) සමබරතාවයෙන් යුතුව යෙදිය යුතුය.
(4) උඩු යටිකුරු කොට යෙදිය යුතුය.

(09) ස්තූපයක ඇති දේවතා කොටුව,

(1) සමචතුරස්‍රාකාර ය.
(2) පංචකෝණාස්‍රාකාර ය.
(3) ත්‍රිකෝණාකාර ය.
(4) සිලින්ඩරාකාර ය.

(10) සිංහල පැරපිලි මූලිකාංග වර්ගීකරණයේ දී පැරපිලි අඩු ප්‍රමාණයක් අයත් වර්ගය වන්නේ,

(1) දිව්‍ය
(2) සත්ත්ව
(3) උද්භිද
(4) නිර්ජීව

(ලකුණු 2 × 5 - 10)

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති ප්‍රකාශ නිවැරදි නම් '✓' ලකුණ ද වැරදි නම් '×' ලකුණ ද ප්‍රශ්නය ඉදිරියේ වූ වරහන තුළ යොදන්න.

(11) බෞද්ධ ස්තූපවල හතරැස් කොටුව යනුවෙන් හඳුන්වන අංගය ඉන්දියාවේ සාංචි ස්තූපයේ හර්මිකාව නමින් හැඳින්වේ. (     )

(12) හින්දු කෝවිලක මණ්ඩපය වටා ප්‍රදක්ෂිණා පථය යොදා ඇත. (     )

(13) මජ්ජිදය තුළ දක්නට ඇති සිතුවම් විචිත්‍රවත් වර්ණ වලින් යුක්තය. (     )

(14) ක්‍රිස්තියානි ආගමික දේවස්ථානවල දිග් ශාලාවේ එක් පසකට වන්නට අල්තාරය පිහිටා ඇත. (     )

(15) ඉස්ලාම් බැතිමතුන්ගේ උපවාස කාලයේ දී දෙන අනිවාර්ය දානය 'සදකා' නමින් හැඳින්වේ. (     )

(ලකුණු 2 × 5 - 10)

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා පිළිතුරු සැපයීමේ දී පහත දී ඇති රූප සටහන් උපයෝගී කරගන්න.

A



B



C



D



E



(16) A රූප සටහනෙහි දක්වෙන ගෘහ නිර්මාණ අංගය කුමක් ද? ..............................

(17) B රූප සටහනෙහි දක්වෙන ඊතලයෙන් පෙන්වා ඇති නිර්මාණය හඳුන්වන්නේ කෙසේ ද? ..............................

(18) C රූප සටහනෙහි දක්වෙන වාස්තු විද්‍යා අංගය නම් කරන්න. ..............................

(19) D රූප සටහනෙහි දක්වෙන චෛත්‍යයේ හැඩය නම් කරන්න..............................

(20) E රූප සටහනින් දක්වෙන්නේ කුමන ලක්ෂණ සහිත ආගමික ගෘහ නිර්මාණයක කොටසක් ද? ..............................

(ලකුණු 2 × 5 -10)

(මුළු ලකුණු 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 06 - ශ්‍රේණිය

## චිත්‍ර කලාව

කාලය: පැය 2යි.

### II කොටස

පහත සඳහන් 'අ', 'ආ' හෝ 'ඉ' කොටසින් එක් මාතෘකාවක් තෝරා ගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණයක් කරන්න.

#### 'අ' කොටස (ප්‍රකාශන චිත්‍ර)

01. පෝය දා පන්සලේ බැතිමතුන්
02. අපේ ගමේ වෙළඳ පොළ / අවුරුදු දා නෑදෑයෝ ඇවිත්

#### 'ආ' කොටස (මෝස්තර චිත්‍ර)

03. මල් කොළ යෙදූ විත්ත රෙදි මෝස්තරයක්
04. ජ්‍යාමිතික හැඩ යොදා නැගී දවටනයකට සුදුසු මෝස්තරයක්

#### 'ඉ' කොටස (ග්‍රැෆික් චිත්‍ර)

05. පාසලේ ක්‍රීඩා උත්සවය සඳහා ආරාධනා පත්‍රයක්
06. ළමා කතන්දර පොතක් සඳහා පිට කවරයක්

(ලකුණු 60)